# බෞද්ධ සංස්කෘතිය
# (Buddhist Culture)
# (BUCU)

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

# විෂය නිර්දේශය


දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය



www.cdce.kln.ac.lk

**<u>නව විෂය නිර්දේශය</u>**

ප්‍රථම මුද්‍රණය - 2022

මෙම විෂය නිර්දේශයන්හි අන්තර්ගත කරුණු අදාළ අධ්‍යයන අංශයන්ට හිමි වන අතර මෙහි ප්‍රකාශන අයිතිය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සතු වේ.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් ලිඛිත අවසරයකින් තොරව මෙහි සඳහන් කරුණු උපුටා දැක්වීම මුද්‍රණය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රකාශනය :**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

*කැලණිය විශ්වවිද්‍යාලය*

*කැලණිය*

# බෞද්ධ සංස්කෘතිය

| ස්තරය | සමාසිකය | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | අනිවාර්ය/ වෛකල්පික | අධ්‍යයන සම්භාර |
|---|---|---|---|---|---|
| 01 | I සහ II | BUCU 18214 | භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම | අනිවාර්ය | 4 |
| | | BUCU 18224 | ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා සාහිත්‍ය විචාරය | අනිවාර්ය | 4 |
| 02 | III සහ IV | BUCU 28214 | බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා | අනිවාර්ය | 4 |
| | | BUCU 28224 | බෞද්ධ සමාජ චින්තාව, උපදේශනය සහ පූජා චාරිත්‍ර | අනිවාර්ය | 4 |
| 03 | V සහ VI | BUCU 38214 | බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය | අනිවාර්ය | 4 |
| | | BUCU 38224 | ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය හා බෞද්ධ සම්ප්‍රදායන් | අනිවාර්ය | 4 |

# ප්‍රථම වසර

# BUCU 18214
# BUCU 18224

**පාඨමාලා කේතය** :- **BUCU 18214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- භාරතීය සංස්කෘතික පසුබිමේ ස්වභාවය හඳුනා ගනියි;
- විවිධ ආගමික හා සංස්කෘතික භාවිතයන් ඒවායේ අන්‍යොන්‍ය සබඳතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරිත්වය විස්තර කරයි;
- බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම හඳුනා ගනියි;
- බෞද්ධ ඉගැන්වීම් සාම්ප්‍රදායික භාරතීය සංස්කෘතියට වඩා න්‍යායෙන් හා භාවිතයෙන් වෙනස් වන අයුරු පෙන්වා දෙයි;
- බෞද්ධ මූලධර්ම මත ගොඩ නැගුණු බෞද්ධ සංස්කෘතියේ පදනම විස්තර කරයි;
- බුදුදහමේ මූලධර්ම අනුව ජීවන රටාව හැඩ ගස්වා ගනියි.

**පාඨමාලා අන්තර්ගතය** :-

ප්‍රාග් වෛදික යුගයේ ආගමික විශ්වාස, ජගන්මාතා වන්දනය, යෝග අභ්‍යාස පැවති බවට සාධක, වෛදික යුගය, ආර්යාගමනයෙන් පසු භාරතය තුළ පැතිරී ගිය බහුදේවවාදය; එහි ස්වභාවය සහ සුවිශේෂ ලක්ෂණ හා එය ඒකදේවවාදයක් දක්වා සංවර්ධනය වීම සහ ඒ සඳහා බලපෑ සාධක, බ්‍රාහ්මණයුගය, වේදයේ අධිකාරිත්වය, ආගමික සංවිධානය,

පැවිදි සංස්ථාව, නිර්මාණවාදය, ආත්මවාදය, යාගය, බ්‍රහ්ම සහව්‍යතාව, වර්ණධර්ම, ආශ්‍රමධර්ම, ස්වධර්ම, ආපද්ධර්ම, ආරණ්‍යයක යුගයේ උදාව, සත්‍ය ගවේෂණය, ඥාන මාර්ගයට ක්‍රමානුකූල ව නැඹුරු වීම, උපනිෂද් යුගය, ආත්ම සහ බ්‍රහ්ම සංකල්ප සහ ඒවායේ ඒකත්වය, ශ්‍රමණ සම්ප්‍රදාය, එහි සුවිශේෂ ලක්ෂණ, ආචාර්ය පරපුර සහ ප්‍රතිපත්ති, මුල් ආචාර්යවරුන්, අකිරියවාදය, නියතිවාදය, සංශයවාදය, ආත්මවාදය සහ විමුක්තිය.

සන්තානගත සහ සමාජගත අතෘප්තිය පිළිබඳ දැනුම සමග ජීවිතාවබෝධය (චතුරාර්ය සත්‍යය ඇසුරින්), සියලු ප්‍රපඤ්චයන්ගේ විශ්වීය යථාර්ථය පිළිබඳ අවබෝධය (ත්‍රිලක්ෂණය ඇසුරින්), සැපෙහි හා දුකෙහි, ලාභයෙහි සහ අලාභයෙහි හේතු-ඵල සබඳතාව (පටිච්ච සමුප්පාදය ඇසුරින්), ශ්‍රද්ධාව, සදාචාරය, හොඳ සහ නරක ක්‍රියා යනාදි බෞද්ධ ඉගැන්වීම්හි ප්‍රායෝගික වටිනාකම, පුද්ගලික සහ සමාජීය ජීවිතය වැනි ඉගැන්වීම්හි වලංගුතාව, ගිහියන් සඳහා වන බෞද්ධ පිළිවෙත් (සාමීචිපටිපදාව) සහ උතුම් බෞද්ධ ජීවන පිළිවෙත, නිර්මාණවාදය සහ ආත්මවාදය පිළිබඳ බෞද්ධ ආකල්පය, සමාජ ස්තරායණය සහ මානව ඒකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්, කාන්තාවන් සහ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ වෛද-බ්‍රාහ්මණ සහ බෞද්ධාකල්පය, සිතීමේ හා විමසීමේ නිදහස

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. ගල්මංගොඩ, සුමනපාල, (1994), ආදි බෞද්ධ දර්ශනය, අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත.
2. රාහුල හිමි, රත්නපුරේ, (1988), බුදුසමයේ උදාව, ප්‍රගති ප්‍රකාශකයෝ, බාදුරාගොඩ.
3. මේධානන්ද හිමි, දේවාලේගම, (2007), බෞද්ධ අධ්‍යයන ප්‍රවේශය, දයාවංශ ජයකොඩි සමාගම, මරදාන.
4. රාහුල හිමි, වල්පොළ‍ණී (1964), බුදුන් වදාළ ධර්මය, ගුණසේන සහ සමාගම, කොළඹ.
5. සෝමරංසි හිමි, උඩගලදෙනියේ, (1970), බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය, කතෘ ප්‍රකාශන, තලාව.
6. Barua, B.M., (1921), A History of Pre-Buddhist Indian Philosophy, Motilal Barnasidass, Delhi.
7. Kalupahana, David, J.,(1976), Buddhist Philosophy, A Historical Analysis, The University of Honalulu, Honalulu.

**පාඨමාලා කේතය** :- **BUCU 18224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා සාහිත්‍ය විචාරය

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- අදාළ මූලාශ්‍රයන්හි සංයුතිය, අන්තර්ගතයන් සහ පාරිභාෂික පද හඳුනා ගනියි;
- බෞද්ධ සංස්කෘතිය අධ්‍යයනය සඳහා ඒවායේ ඇති වැදගත්කම පෙන්වා දෙයි;
- බෞද්ධ සාහිත්‍ය කෘති ඇගයීමට උනන්දු වෙයි;
- නව සාහිත්‍ය කෘති රචනා කිරීම සහ ආගමික අදහස් රසවත් ලෙස ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.

**පාඨමාලා අන්තර්ගතය** :-

සිඟාලෝවාද සූත්‍රය; බෞද්ධ ගිහි ආචාර ධර්ම, මහා පරිනිබ්බාන සූත්‍රය; බුද්ධචරිතය සහ නායකත්වය. සක්කපඤ්හ සූත්‍රය; සෞන්දර්ය පිළිබඳ බෞද්ධාකල්පය, මහාවග්ග පාළියේ මහාක්ඛන්ධකය; බෞද්ධ භික්ෂු ජීවිතය; භික්ඛු පාතිමොක්ඛය හා සේඛියා; බෞද්ධ ආරාමික ආචාර ධර්ම.

බුදුසමය සහ සාහිත්‍ය, බෞද්ධ සූත්‍රයන්හි සාහිත්‍යමය පැතිකඩ, කථා, ගාථා, උපමා සහ භාෂා භාවිතයේ විශේෂතා, ආඛ්‍යාන සහ විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණ, වැනි සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන්හි එන බුද්ධචරිතය හා සම්බන්ධ ප්‍රශංසාත්මක ඡේද, ජාතක සාහිත්‍යය; එහි මනෝවිද්‍යාත්මක වටිනාකම, සමාජ විචාරය, හාස්‍යය සහ සාහිත්‍යමය අගය, සද්ධර්මරත්නාවලිය වැනි ශ්‍රී ලාංකේය ස්පර්ශයක් සහිත බෞද්ධ

සම්භාව්‍ය කෘති: ඒවායෙහි උපදේශාත්මක සහ සාහිත්‍යමය අගය බෞද්ධ වීරකාව්‍ය, බෞද්ධ උපදේශාත්මක සාහිත්‍ය, ජාතක පද්‍ය සහ බෞද්ධ නාට්‍ය; දොරකඩ අස්න.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**

1. ගල්මංගොඩ, සුමනපාල, (1994), **ආදි බෞද්ධ දර්ශනය**, අභය මුද්‍රණ ශිල්පියෝ, කඩවත.
2. ධර්මසිරි. ගුණපාල. (1977), **බෞද්ධ සදාචාරයේ මූලධර්ම,** සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ.
3. වික්‍රමසිංහ, මාර්ටින්, (1956), **බණකථා සාහිත්‍යය,** සමන් ප්‍රින්ටර්ස්, කොළඹ.
4. වික්‍රමසිංහ, මාර්ටින්, (1966), **සිංහල සාහිත්‍යයේ නැගීම**, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.
5. **සද්ධර්මරත්නාවලිය**, (1985), ද්විතීය භාගය, ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රකාශය, කොළඹ.

6. සුමනසාර හිමි, කරහම්පිටිගොඩ, (1972), **ථෙර ථෙරීගාථා පාළි,** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 28, ලංකාණ්ඩුව.
7. සෝරත හිමි සංස්කරණය. (1966), **විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුද්ධචරිතය, බුත්සරණ**, සමයවර්ධන, කොළඹ.

# දෙවන වසර

# BUCU 28214
# BUCU 28224

**පාඨමාලා කේතය** :- **BUCU 28214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- බෞද්ධ සංඝ සමාජය, නිශ්චිත අරමුණු සහ ප්‍රතිපත්තිවලින් සමන්විත සමාජ ආයතනයක් ලෙස හඳුනා ගනියි.
- සංඝ සමාජයේ ව්‍යුහය හඳුනාගෙන එහි ක්‍රියාකාරකම් ආදර්ශයට ගනියි.
- සෞන්දර්ය යන්න හඳුනා ගෙන ඒ කෙරෙහි සංවේදී වෙයි.
- පැරණි බෞද්ධ කලාකෘති පිළිබඳ ව දැනුවත් වෙයි.
- බෞද්ධ නිර්මාණ කුසලතා පිළිබඳ උනන්දුව වර්ධනය කර ගනියි.
- පුරාවස්තු සහ ජාතික උරුම සංරක්ෂණය කිරීමේ පුරෝගාමියෙකු වෙයි.

**පාඨමාලා අන්තර්ගතය** :-

භික්ෂු - භික්ෂුණී සංස්ථාවන්හි ප්‍රභවය හා විකාශය, පැවිද්ද හා උපසම්පදාව, විනය පැනවීමේ අරමුණු, භික්ෂු -භික්ෂුණීන්ට අදාළ ආදි බ්‍රහ්මචරියක සහ ආභිසමාචාරික ශික්ෂා, සංඝකර්මවල අරමුණු සහ ක්‍රියාකාරිත්වය, බුද්ධකාලීන ප්‍රකට ශ්‍රාවකශ්‍රාවිකා චරිතාපදාන, ආරාම

පරිපාලනය හා කළමනාකරණය, දකුණු ආසියාවේ බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ ආරම්භය හා විකාශය, ස්තූප නිර්මාණයේ පසුබිම හා විකාශය, බුද්ධප්‍රතිමා නිර්මාණයේ පසුබිම හා විවිධ සම්ප්‍රදායන්, බුද්ධප්‍රතිමා සහ බෝධිසත්ත්ව ප්‍රතිමාවලට අදාළ මුද්‍රා, ආසන සහ සංකේත, පැරණි බෞද්ධ ද්වාරමණ්ඩප, ඒවාට සම්බන්ධ මූර්ති සහ කැටයම්, පටිමාඝර, ආසනඝර, බෝධිඝර, චේතියඝර, බෞද්ධ චිත්‍ර කලා ඉතිහාසය හා එහි සුවිශේෂතා.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**

1. චන්දවිමල හිමි, රේරුකානේ, (1960), **ශාසනාවතරණය**, ඒ.ඩී. ප්‍රේමසිරි සුගතදාස, කොළඹ.
2. ධම්මදස්සි හිමි, දොඩම්කුඹුරේ, (2008), **ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය හා සංවර්ධනය,** දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.
3. මේධානන්ද හිමි, දේවාලේගම, (1990), **භික්ෂු සමාජය**, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.
4. වත්තල, සරත්, (1963), **භාරතීය බෞද්ධ කලා ශිල්ප,** එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ.

5. වික්‍රමගමගේ, චන්ද්‍ර, (1990), **ස්තූප හා ශ්‍රී ලංකා සංස්කෘතිය,** ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, නුගේගොඩ.
6. Dhirasekara, J., (1982), **Buddhist Monastic Discipline**, Ministry of Higher Education, Colombo.
7. Seneviratne, Anuradha, (1992), **Buddhist Monastic Architecture**, Delhi.

| | |
|---|---|
| **පාඨමාලා කේතය** | :- **BUCU 28224** |
| **වර්ගය** | :- හර |
| **මාතෘකාව** | :- **බෞද්ධ සමාජ චින්තාව- උපදේශනය සහ පූජා චාරිත්‍ර** |
| **ඉගෙනුම් පල** | :- |

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- බෞද්ධ සමාජ චින්තනයට අදාළ මූලික මූලධර්ම හඳුනා ගනියි.
- මනුෂ්‍ය වර්ගයාගේ ඒකත්වය ගැන දැනුම්වත් වෙයි.
- සමාජ උන්නතිය සඳහා කටයුතු කරයි.
- සමාජ සංහිඳියාවට දායක වෙයි.
- සාපරාධී හැසිරීම්වලින් වැළකී යහපත් චර්යාවල නිරත වෙයි.
- යහපත් ජීවනෝපායකට හුරු වෙයි.
- මානව ආධ්‍යාත්මිකත්වය සහ එහි සුරක්ෂණය පිළිබඳ බෞද්ධ මතය හඳුනාගනියි.
- තමන්ගේ සහ අන් අයගේ ජීවිත කෙරෙහි ධනාත්මක ආකල්පයක් ඇති කර ගනියි.
- ආධ්‍යාත්මිකත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මත පදනම් ව පෞරුෂය ගොඩනගා ගනියි.
- මානව ගැටලු ස්ථිරව විසඳීමට බෞද්ධ න්‍යායන් භාවිත කරයි.
- බෞද්ධ චාරිත්‍ර හා වාරිත්‍ර පිළිබඳ දැනුමක් ලබයි.

- ගුණාත්මක තෘප්තිමත් භාවයකින් යුතුව විවේක කාලය ගත කිරීමට නැඹුරු වෙයි.
- සමගියෙන් හා සාමයෙන් ජීවත් වීමට හුරු වෙයි.

**පාඨමාලා අන්තර්ගතය :-**

සමාජ චින්තාවේ ස්වභාවය, විෂය පථය සහ අරමුණු, සමාජ ප්‍රභවය හා විකාසය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්, වාර්ගික බේදීම් සහ අසමානතාව, මානව ශක්‍යතාව, මානව වර්ගයාගේ ඒකත්වය, මිනිසාගේ පරමාධිපත්‍ය, පුද්ගල සහ සමාජ අන්තර්ක්‍රියා සහ සම්බන්ධතා, සමාජ සංකීර්ණත්වය මත පදනම් වූ සමාජ ගැටලු, සමාජ ප්‍රගතිය හා පරාභවය, ධනය සහ එහි උපයෝගිතාව, බෝධිසත්ත්ව දර්ශනය හා චරණය, රාජ්‍ය ප්‍රභවය හා පාලනය, විශ්ව රාජ්‍ය සංකල්පය, නීතිය, අපරාධ සහ දඬුවම (බෞද්ධ විනය ආශ්‍රිතව), ආගමික සහජීවනය හා සහනශීලිත්වය, සමාජ ගැටලු විසඳීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය, ගිහි - පැවිදි සම්බන්ධය. මානව මනෝවිද්‍යාව හා ආධ්‍යාත්මිකත්වයේ වැදගත්කම, මානව පෞරුෂය හා ගැටලු පිළිබඳ බෞද්ධ විශ්ලේෂණය, මනස පිළිබඳ බෞද්ධ න්‍යාය හා එහි ක්‍රියාකාරිත්වය, ත්‍රිශික්ෂා මත පදනම් වූ ආධ්‍යාත්මික වර්ධනය පිළිබඳ බෞද්ධ ක්‍රමවේද, භාවනාව මානසික සෞඛ්‍ය සහ එහි ප්‍රතිලාභ, අන්තර් පුද්ගල ගැටුම් සහ බෞද්ධ විසඳුම්වල මනෝවිද්‍යාත්මක මූලයන්, විවිධ බෞද්ධ සංස්කෘතික චාරිත්‍ර වාරිත්‍රවල ව්‍යූහාත්මක රටා සහ ඒවායෙහි ඇති ආධ්‍යාත්මිකත්වය සමතුලිත කිරීමේ හැකියාව, ධනාත්මක චින්තනය සහ ස්වයං උත්තේජනය, හැඟීම් පාලනය කිරීම, සතුට පිළිබඳ බෞද්ධ මතය, බෞද්ධ සංජානන චර්යාත්මක චිකිත්සාව, කායික කේන්ද්‍රගත චිකිත්සාව, පුද්ගල ප්‍රතිසාධනය ඉලක්ක කරගත් ප්‍රවේශයන් සහ බුදුදහමෙන් අනාවරණය වන චිකිත්සක ක්‍රමවේද, පූජා චාරිත්‍ර පිළිබඳ මුල් බුදුදහමේ ආකල්පය, ථෙරවාද බෞද්ධ සංස්කෘතියේ පූජා චාරිත්‍රවල සම්භවය සහ විකාශය, පාලි මූලාශ්‍රයවලින්

සහ ථෙරවාද සම්ප්‍රදායේ පසුකාලීන කෘතීන්ගෙන් ඊට ලැබී ඇති දායකත්වය, ථෙරවාද බෞද්ධ ඉතිහාසයේ සඳහන් වී ඇති පැරණි බෞද්ධ විශ්වාස සහ උත්සව, ත්‍රිවිධ චෛත්‍යය සංකල්පය සහ ඒ හා සම්බන්ධ ආගමික චාරිත්‍ර බෝධිපූජා, ධාතුපූජා, චෛත්‍යය පූජා සහ විවිධ උත්සව, ආගමික පෙරහැර, බෞද්ධ ආගමික කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය, පුණ්‍යානුමෝදනා කිරීම සහ එහි ආගමික පදනම, පිරිත් සජ්ඣායනය, එහි ඉතිහාසය සහ අරමුණු, දේශීය වශයෙන් පැවැත්වෙන බලි, තොවිල්, ශාන්තිකර්ම යනාදිය කෙරෙහි බුදුදහමේ බලපෑම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. බෞද්ධ සමාජ දර්ශනය, (1995), **බුද්ධ ශාසන අමාත්‍යාංශය,** බෞද්ධ විශ්වකෝෂ ග්‍රන්ථමාලා අංක 03.
2. මේධානන්ද හිමි, දේවාලේගම, ධම්මරතන හිමි, තැරැලේ, විජයසිංහ, ගාමිණී, ඩබ්.ඒ., (2010), **බෞද්ධ සංස්කෘතිය, සමාජ චින්තනය, පුදසිරිත් හා උත්සව,** කොළඹ.
3. සෝමරංසි හිමි, උඩගලදෙනියේ, (1970), **බෞද්ධ දර්ශනය හා සමාජ දර්ශනය,** පී.ජී. අබේකෝන් බණ්ඩාර, තලාව.

4. ගල්මංගොඩ, සුමනපාල., (2006). **බෞද්ධ භාවනාව හා මනෝචිකිත්සාව** , සරසවි, දිවුලපිටිය.
5. ඤාණතිලක හිමි, තිස්ස, (1979), **මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය**, ඩී.කේ.කරුණාරත්න, මොරටුව.
6. De Silva, Padmasiri., (2014). **An Introduction to Buddhist Psychology and Counselling**, Palgrave Macmillan, London.
7. Nissanka. H.S.S., (2001). **Buddhist Psychotherapy**, Gunasena, Colombo.

# තෙවන වසර

# BUCU 38214
# BUCU 38224

**පාඨමාලා කේතය** :- **BUCU 38214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියානු ව්‍යාප්තිය

**ඉගෙනුම් පල** :-

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- දහසයවන සියවසේ සිට ශ්‍රී ලංකාවේ සංස්කෘතියට එල්ලවුණු බටහිර ආක්‍රමණිකයන්ගේ ප්‍රතිගාමී බලපෑම අවබෝධ කරගෙන ශ්‍රී ලංකාවේ අනන්‍යතාව රැකගැනීමෙහිලා පුරෝගාමී වෙයි.
- ජාතික සමාජ සහ ආගමික උන්නතිය සඳහා ඉමහත් කැපවීමක් කළ බෞද්ධ මුතුන්මිත්තන්ගේ ක්‍රියාකාරකම් ආදර්ශයට ගනී.
- බෞද්ධ සංස්කෘතිය භාරතීය සීමාවෙන් ඔබ්බට අනෙකුත් රටවලට ව්‍යාප්ත වීම පිළිබඳ සොයා බලයි.
- බුදුදහම ව්‍යාප්ත කිරීම පිණිස තම ජීවිත කැප කළ විවිධ නිකායන් සහ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් ආදර්ශයට ගෙන බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට උත්සාහ ගනී.

**පාඨමාලා අන්තර්ගතය** :-

ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ ආරම්භය සහ එහි ඓතිහාසික පසුබිම, රජවරුන්ගේ අනුග්‍රහය හා ශාසනික සංවර්ධනය, ශාසනික හා

සාහිත්‍යයික සේවාවන්හි නිරත වූ පඬිවරු, ශාසන ශෝධන හා කතිකාවත්, යුරෝපීය ජාතීන්ගේ පැමිණීම බෞද්ධ සංස්කෘතිය කෙරෙහි බලපෑ අයුරු, ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේගේ ජාතික හා ආගමික මෙහෙවර, බුද්ධකාලීන ශාසන ව්‍යාප්තියේ පරිමාණය හා ඊට තුඩුදුන් හේතු සාධක, නිකාය භේදයට බලපෑ හේතු, අශෝක යුගයේ බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය පිළිබඳ ඓතිහාසික සාධක, බෞද්ධ විශ්වවිද්‍යාල හා භික්ෂූන්ගේ ධර්මශාස්ත්‍රීය සේවා, තායිලන්තයේ, බුරුමයේ, කාම්බෝජයේ සහ ඉන්දුනීසියාවේ බෞද්ධ සංස්කෘතියේ කැපී පෙනෙන ලක්ෂණ, ඉන්දු - ග්‍රීක හා කුෂාණ පාලන සමයන් බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් වැදගත් වන අයුරු, ඇෆ්ගනිස්ථානයේ හා මධ්‍යම ආසියාතික ක්ෂේමභූමි ජනපදවල බුදුදහමේ ව්‍යාප්තිය, පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සාක්ෂි ඇසුරින් චීනයේ හා ටිබෙටයේ බෞද්ධ සංස්කෘතියේ ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු, කොරියාවේ හා ජපානයේ බුදුසමයේ ව්‍යාප්තිය සම්බන්ධ ඓතිහාසික තොරතුරු

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදි විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම්** :-


1. ආනන්ද හිමි, අම්පාරේ, (2013), **ලංකා බෞද්ධ සංස්කෘතියේ නූතනයුගය** (1), කර්තෘ ප්‍රකාශන, කොළඹ.
2. ආනන්ද හිමි, වැල්ලවත්තේ, සහ කාන්ගහආරච්චි ටී.බී., (1963), **සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය.**
3. පරණවිතාන, එස්., සහ වෙනත් අය (1964 හා 1971), **ලංකා ඉතිහාසය, 1 හා 2 භාග**, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අංශය.
4. රාහුල හිමි, වල්පොළ, (1962), **ලක්දිව බුදුසමයෙහි ඉතිහාසය,** ගුණසේන සහ සමාගම, කොළඹ.
5. වාචිස්සර හිමි, කොටගම, (1960), **සරණංකර සඟරාජ සමය,** වයි දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ.
6. ශාන්ත හිමි, කිරින්දේ, (1962), **මධ්‍ය ආසියවේ බෞද්ධ සංස්කෘතිය**, රත්නාවලී ප්‍රකාශකයෝ, කොළඹ.
7. Hazar, K.L., (1982), **History of Theravada Buddhism in Southeast Asia**, Munshiram Manoharlal, Delhi.
8. Puri, B.N., (1987), **Buddhism in Central Asia**, Motilal Banarsidas, New Delhi.


**පාඨමාලා කේතය** :- **BUCU 38224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය හා බෞද්ධ සම්ප්‍රදායන්

**ඉගෙනුම් ඵල** :-

මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් විද්‍යාර්ථියා;

- වෙනත් ආගම්වලට ගරුකරන, එම ආගමිකයන් හා

සහජීවනයෙන් ක්‍රියාකරන අයෙකු බවට පත්වන අතර ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායන් දෙකෙහි ම අගය හඳුනාගත් අයෙකු බවට පත්වෙයි.

- අන් අයගේ ආගමික නිදහස අගය කරයි.
- අන්‍යාගමික ඉගැන්වීම් බුදුදහම සමග සසඳයි.
- ඔවුන් අතර ඇති සමාන අසමානතා හැඳිනගෙන විවිධ ආගමික පසුබිම් සමග සහජීවනයෙන් ජීවත්වීමට සාමකාමී පරිසරයක් නිර්මාණය කරයි.
- ථෙරවාද හා මහායාන මූලධර්ම අතර සමාන හා අසමානතා පැහැදිලි කරයි.
- ථෙරවාද හා මහායාන වටිනාකම් අගය කරයි.
- සියලු බෞද්ධ සම්ප්‍රදායන් ආරක්‍ෂා කිරීමට පුරෝගාමී වෙයි.

**පාඨමාලා අන්තර්ගතය :-**

ආගම පිළිබඳ මානව විද්‍යාත්මක ස්ථාවරය හා ඒ පිළිබඳ බෞද්ධ විචාරය, බුදුදහම ආගමක් හෝ දර්ශනයක් ලෙස හඳුන්වාදීම හා ඒ හා සම්බන්ධ ගැටලු, හින්දු ආගම, එහි ප්‍රභවය හා විකාශය, එහි පූජනීය ග්‍රන්ථ, මූලික ඉගැන්වීම්, චාරිත්‍ර හා උත්සව, හින්දු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ බෞද්ධ විග්‍රහය, ක්‍රිස්තියානි ධර්මය හා එහි ප්‍රභවය හා පරිණාමය, ක්‍රිස්තියානි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ බෞද්ධ විග්‍රහය, ඉස්ලාම් දහමේ ප්‍රභවය හා පරිණාමය, එහි පූජනීය ග්‍රන්ථ සහ ඉගැන්වීම්, චාරිත්‍රවාරිත්‍ර, ඉස්ලාමීය ඉගැන්වීම් හා බුදුදහම.

ථෙරවාද යන පදය සහ එහි අර්ථ දැක්වීම, ථෙරවාද සම්ප්‍රදායේ ප්‍රභවය, එම සම්ප්‍රදායේ මූලග්‍රන්ථ, ථෙරවාද සම්ප්‍රදායේ සුවිශේෂී ඉගැන්වීම්, ථෙරවාද ආචාර්යවරුන්, සංගායනා, නිකාය භේදය, මහායාන යන පදය සහ එහි අර්ථ දැක්වීම, මහායාන සම්ප්‍රදායේ ප්‍රභවය, එම සම්ප්‍රදායේ

මූලග්‍රන්ථ, මහායාන සම්ප්‍රදායේ සුවිශේෂී ඉගැන්වීම්, මහායාන ආචාර්යවරුන්, මහායානයේ මූලික සංකල්ප, මහායානයේ හා ථේරවාදයේ සම විෂමතා.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. ධම්මදස්සි හිමි, නායිම්බල, (2004), **දේවධර්මවාදී ආගම්**, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, කොළඹ.
2. නානායක්කාර සනත්, (2003), **මුල් බුදුසමයේ සිට වජ්‍රයානය දක්වා**, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්, දෙහිවල.
3. ප්‍රනාන්දු ඇන්ටනී, (2013), **නූතන ලෝකයේ විවිධ ආගම්**, අන්තර් සංස්කෘතික පොත් ප්‍රචාරකයෝ, කඩවත.
4. රාහුල හිමි, අත්තුඩාවේ, මහානාම හිමි, බඹරැන්දේ, (1970), **මහායානය**, දීපානි, නුගේගොඩ.
5. සාසනරතන හිමි, මොරටුවේ, (1956), **ලක්දිව මහායාන අදහස්**, කොළඹ.
6. An Encyclopedia of American World Religions.
7. Tilakaratne, A., & Jr., R. H., (2012). **Theravada Buddhism: The View of the Elders** (Dimensions of Asian Spirituality). University of Hawaii Press.
8. ඛේමානන්ද හිමි, හෑගොඩ, (1992), ථේරවාද න්‍යාය, තරංජී ප්‍රින්ටර්ස්. මහරගම.
9. සිල්වා, පද්මසිරි, (1963), දාර්ශනික ගැටලු, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය.
10. ධර්මසිරි, ගුණපාල, (1970), දාර්ශනික ප්‍රශ්න, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.